Department of Wildlife Conservation | No. 811-A, Jayanthipura Road, Battaramulla | Email - dg@dwc.gov.lk | www.dwc.gov.lk

UK International Development
Partnership | Progress | Prosperity

කළමනාකරණය පිළිබඳ සමාලෝචනයක්

කායන්කර්නි සමුද්‍ර අභය භූමිය

නැගෙනහිර පළාත, මඩකලපුව දිස්ත්‍රික්කය

එයින් ආරක්ෂා කෙරෙන්නේ මොනවාද?



කයන්කර්නි සමුද්‍ර අභය භූමිය නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කායන්කර්නි ගම ආසන්නයේ පිහිටා ඇත. එය, කොරල් පර, මුහුදු තෘණ බිම්, කඩොලාන ඇතුළු සමුද්‍ර පරිසර පද්ධති සහ ඒ ආශ්‍රිත ජෛව විවිධත්වය ආරක්ෂා කරයි. කොරල් පර කොරල් ප්‍රදේශ තුනකට බෙදී පවතින අතර ඒවා නම් එලිෆන්ට් පොයින්ට් හි ශීර්ෂ භූමිය වටා ඇති ආන්තික කොරල්පර පද්ධතියක් (fringing reef), වෙරළ තීරයේ සිට කිලෝමීටර 2 ක් පමණ දුරින් පිහිටි පැච් කොරල් පර පද්ධතියක් (Patch reef) සහ එලිෆන්ට් පොයින්ට් සිට උතුරින් වෙරළට ආසන්න ආන්තික කොරල්පර පද්ධතියක් (fringing reef) වශයෙනි. කායන්කර්නි තුළ දෘඪ කොරල් විශේෂ 50කට වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර ඒවා කොරල් මත්ස්‍ය විශේෂ 200කට වැඩි ගණනක් මෙන්ම මුහුදු තාරකා මසුන්, නුඩිබ්‍රාන්ච්, ඇනිමෝන් වැනි වැදගත් විශේෂ පෝෂණය කරයි. මුහුදු පැලෑටි විශේෂ පහක්ද වාර්තා වී ඇත.

මෙම සමුද්‍ර අභය භූමිය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රදේශයේ විනෝදාස්වාද කටයුතු සඳහා ද ප්‍රාදේශීය ධීවර කර්මාන්තය සඳහා ද වැදගත් වේ.

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත (469 අධිකාරිය) යටතේ 2019 අප්‍රේල් මස සමුද්‍ර අභය භූමියක් ලෙස නම් කරන ලදී.

විශාලත්වය : වර්ග කි.මී 9.53

ප්‍රධාන සාර්ථකත්වයන්

1. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ ප්‍රතිපාධන ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇත.
2. කොරල් පරය සහ එ ආශ්‍රිත ජෛව විවිධත්වය යහපත් තත්ත්වයේ පවතී.
3. සමුද්‍ර අභය භූමිය සඳහා ප්‍රජා සහය සාධනීය වන අතර බොහෝ දෙනාට අභය භූමියේ ඵලදායී කළමනාකාරීත්වය තහවුරු කිරීමට විධිමත් ලෙස සම්බන්ධ වීමට අවශ්‍යව ඇත.
4. සමුද්‍ර අභය භූමියේ ජෛව විවිධත්වය පිළිබඳව මෙන්ම ප්‍රජාව වෙත එමගින් සපයන සමාජ සහ ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව දත්ත එක් රැස් කිරීමට සක්‍රිය අධීක්ෂණ සහ පර්යේෂණ වැඩසටහනක් ඇත.
5. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමුද්‍ර අභය භූමිය කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා සහය ලබා ගැනීමට රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව කටයුතු කරයි.

ආරක්ෂිත ප්‍රදේශයේ කළමනාකරණ ඵලදායිතාව සමාලෝචනය

ආරක්ෂිත ප්‍රදේශයක් නම් කරන විට, එය කෙතරම් හොඳින් කළමනාකරණය වන්නේ ද යන්න අවබෝධ කරගැනීම වැදගත් ය. කළමනාකරණයේ ඵලදායිතාව ඇගයීමට විවිධ ක්‍රම භාවිත කළ හැකි ය. එසේ භාවිත කරන ක්‍රම අතුරින් වඩාත් බහුලව යොදා ගැනෙන්නකි කළමනාකරණ ඵලදායිතා නිරීක්ෂණ මෙවලම (METT-4). මෙයට කළමනාකරණ තේමාවන් පහක් වටා පදනම් වුණු ප්‍රශ්න 38කට පිළිතුරු සැපයීම ඇතුළත් වෙයි.



අප සිදු කළ දේ

සමුද්‍රිත රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන (Ocean Country Partnership Programme - OCPP) සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ලද හැකි සාක්ෂ්‍ය සමාලෝචනය කරමින් සහ නීල සම්පත් භාරය (Blue Resources Trust – BRT) විසින් පහසුකම් සලසන ලද වැඩමුළුවක් සහ රැස්වීම් තුළින් දේශීය පාර්ශ්වකරුවන් 28 දෙනෙකු සමග කටයුතු කරමින් 2024 ජනවාරි 29 වෙනි දින කායන්කර්නි සමුද්‍ර අභය භූමිය ඇගයීමට ලක් කරන ලදී. වඩාත් හොඳින් සිදුවන්නේ කුමක් ද යන්නත් කළමනාකරණය වැඩි දියුණු කිරීමට ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද යන්නත් අපි හඳුනාගෙන ඇත්තෙමු.

පාර්ශ්වකරුවන්

සමාලෝචනය හා සම්බන්ධ අංශ:

හඳුනාගත් තර්ජන

- නීති විරෝධී මසුන් ඇල්ලීම
- කාලගුණ විපර්යාසය
- සංචාරක කර්මාන්තය
- දූෂණය
- වෙරළ සංවර්ධනය
- ආක්‍රමණික ඇල්ගී

කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රධාන ක්‍රියාමාර්ග

- මීළඟ වසර පහ තුළ ගත යුතු ප්‍රධාන ක්‍රියාමාර්ග ඇතුළත් කරමින් SMART (නිශ්චිත, මැනිය හැකි, සාක්ෂාත් කරගත හැකි, අදාළ සහ කාල සීමාවක් වෙන් කෙරුණු) කළමනාකරණ සැලැස්මක් සංවර්ධනය කිරීම සහ පාර්ශ්වකරු ආදායයන්ට අවස්ථාව සැපයීම.
- කළමනාකරණ ක්‍රියාමාර්ග (පවතින පුළුල් ක්‍රියාමාර්ග සහ ආරක්ෂිත ප්‍රදේශයට නිශ්චිත) ක්‍රියාත්මක කර බලාත්මක කරන බව සහතික කරගැනීම, එනම්, නීති විරෝධී මසුන් ඇල්ලීමේ ක්‍රම තහනම් කිරීම යනාදිය.
- සමුද්‍ර අභය භූමිය සඳහා වනජීවී නිලදාරීන් වෙන් කිරීම.
- සමුද්‍ර අභය භූමිය කළමනාකරණයේ දී සම්බන්ධ විය හැකි සහ සම්බන්ධ විය හැකි ආකාරය දැනගැනීම සඳහා සහ තීරණ සහ ප්‍රගතිය පිළිබඳව දැනුවත් වීම සඳහා ප්‍රාදේශීය පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවීම.
- කඩොලාන වාසභූමියේ තත්ත්වය වඩා හොඳින් අවබෝධ කරගැනීම පිණිස එහි ප්‍රමාණය සහ තත්ත්වය අධීක්ෂණය කිරීමට කටයුතු කිරීම.

වාසභූමිය/විශේෂය	තත්ත්වය	ප්‍රවණතාව
කොරල් පරය	යහපත්	ස්ථායීය
මුහුදු පැලෑටි	සාමාන්‍ය	ස්ථායීය
කොරල් පර මත්ස්‍යයන්	යහපත්	ස්ථායීය
කඩොලාන	සාමාන්‍ය	ස්ථායීය

METT කළමනාකරණ සංරචක සඳහා METT ලකුණු ප්‍රමාණය

36 — මුළු සංරචක ඇගයීම් ලකුණ
114 — මුළු උපරිම සංරචක ලකුණු



මීළඟ පියවර

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ඉදිරි කාලයේ ප්‍රමුඛතා නිර්ණය කිරීමට ඇගයීමේ ප්‍රතිඵල භාවිත කරනු ඇත.